නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

E-mail : info@cida.gov.lk    Website : http://www.cida.lk

CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY (SUCCESSOR TO ICTAD)

# පුරප්පාඩු

## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

### ජ්‍යෙෂ්ඨ කළමනාකරු සේවා කාණ්ඩය HM 2-1

**1 අධ්‍යක්ෂ ජනරාල් HM 2-1 - තනතුරු 01**

➢ **සුදුසුකම් හා සේවා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී, ඉංජිනේරු විද්‍යාව / වාස්තු විද්‍යාව / ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) / ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය (SLIA) / ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතනය (IQSSL) විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සහ

අදාළ ක්ෂේත්‍රයේ පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක / සංස්ථාවක / රජයේ පිළිගත් ආයතනයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ප්‍රධාන ඉදිකිරීම් කටයුතුවල සියලුම පුළුල් ක්ෂේත්‍රවල "කළමනාකරණ මට්ටමක" වසර 20ක අවම පළපුරුද්දක් ලබා තිබීම සහ ඉන් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්දක් තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංජිනේරු විද්‍යාව / වාස්තු විද්‍යාව / ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාවේදී උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) / ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය (SLIA) / ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතනය (IQSSL) විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සමග

(අ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM 1-3) සේවා කාණ්ඩයේ අවම වශයෙන් වසර 07 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

සහ

(ආ) බහුවිධ විෂයන්ගෙන් යුත් කණ්ඩායම්වලට නායකත්වය ලබාදීම සහ මග පෙන්වීමට හැකිවීම, මානව සම්පත සහ වෙනත් සම්පත් නිසිලෙස යෙදවීමේ සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ හැකියාව පළපුරුද්ද

### ජ්‍යෙෂ්ඨ කළමනාකරු සේවා කාණ්ඩය - HM 1-3

**2. අධ්‍යක්ෂ (මුදල්) - HM 1-3 - තනතුරු 01**

➢ **සුදුසුකම් හා සේවා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මූල්‍ය කළමනාකරණය / ගිණුම්කරණය / වාණිජ්‍යය / ගිණුම්කරණය හා ව්‍යාපාර මූල්‍ය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සමග

රාජ්‍ය මූල්‍ය කළමනාකරණය / ගිණුම්කරණය / මූල්‍ය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL) / වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CIMA) / සහතිකලත් ගණකාධිකාරීන්ගේ සංගමය (ACCA) යන වෘත්තීය ආයතනයක සමාජිකත්වය ලබා තිබීම.

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක මූල්‍ය කළමනාකරණය / ගිණුම්කරණය / විගණන යන ක්ෂේත්‍රයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක, මූල්‍ය කළමනාකරණය / ගිණුම්කරණය / විගණන යන ක්ෂේත්‍රයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් ( පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
2. මූල්‍ය කළමනාකරණ / ගිණුම්කරණය / විගණනය යන ක්ෂේත්‍රයක කළමනාකරු සේවා කාණ්ඩයේ (MM) – I වන ශ්‍රේණියේ තනතුරක වසර 05 ට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

### කළමනාකරු සේවා කාණ්ඩය - MM 1-1 - II ශ්‍රේණිය

**3. සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) - MM 1-1 - II ශ්‍රේණිය - තනතුරු 01**

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මූල්‍ය / ගණකාධිකරණ / වාණිජ / ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) අන්තර් මධ්‍ය විභාගය හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) / සහතිකලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) I හා II කාණ්ඩයේ විභාග සමත්වී තිබීම.

සමග

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ අවම වශයෙන් වසර 01 ක විධායක මට්ටමේ තනතුරක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**සටහන :** පරිගණක ගත ගිණුම්කරණ කටයුතු පිළිබඳ හැකියාව අමතර සුදුසුකමක් සේ සැලකේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකරු සේවා කාණ්ඩයේ (JM) ගිණුම් නිලධාරී / විගණන නිලධාරී තනතුරේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**4. සහකාර අධ්‍යක්ෂ (දේපළ සංවර්ධන හා අමුද්‍රව්‍ය සැපයුම් ලියාපදිංචිය) - MM 1-1 - II ශ්‍රේණිය - තනතුරු 01**

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු විද්‍යාව හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

02. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක (IESL) ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සමග

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක විධායක මට්ටමේ තනතුරක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකරු සේවා කාණ්ඩයේ (JM) ඉංජිනේරු සහකාර / පුහුණු කිරීමේ නිලධාරී තනතුරේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**5. සහකාර අධ්‍යක්ෂ (ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු) - MM 1-1 -II ශ්‍රේණිය - තනතුරු 01**

**සේවා ස්ථානය - ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහල - අනුරාධපුර (ගල්කුලම)**

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් යාන්ත්‍රික / මෙකාට්‍රොනික්ස් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

2. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක (IESL) ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සමග

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක විධායක මට්ටමේ තනතුරක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකරු සේවා කාණ්ඩයේ (JM) යාන්ත්‍රික ඉංජිනේරු සහකාර / පුහුණු කිරීමේ නිලධාරී තනතුරේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

### කනිෂ්ඨ කළමනාකරු සේවා කාණ්ඩය (JM 1-2) - II ශ්‍රේණිය

**6. කාර්මික හා නඩත්තු නිලධාරී JM 1-2 - II ශ්‍රේණිය - තනතුරු 01**

**සහ**

**7. පුහුණු කිරීමේ නිලධාරී - JM 1-2 - II ශ්‍රේණිය - තනතුරු 02**

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)**

1. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 07 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 06 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා සුදුසුකම ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද ලබා තිබීම.
3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 10 ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 )**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවාවක් සම්පූර්ණ කිරීම.

**8. රහස්‍ය ලේකම් JM 1-2-II ශ්‍රේණිය - තනතුරු 02**

➢ **සුදුසුකම් හා සේවා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම හා සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම හා විශිෂ්ට ලේකම් කුසලතා හා දෙමළ භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අමතර සුදුසුකමක් වේ.
2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 06 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක සේවා පළපුරුද්ද ලබා තිබීම සහ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම හා විශිෂ්ට ලේකම් කුසලතා ලබා තිබීම.
4. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 10 ක සේවා පළපුරුද්ද ලබා තිබීම සහ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම හා විශිෂ්ට ලේකම් කුසලතා ලබා තිබීම.

සහ

(අ) ලඝු ලේඛන (Stenography) සහ පරිගණක ආශ්‍රිතව ස්වාධීනව ලිපි ලේඛන සම්බන්ධ කටයුතු කිරීමේ හැකියාව

(ආ) ලඝු ලේඛන (Shorthand) / යතුරු ලියන හැකියාව (Typing)

ලඝු ලේඛන වේගය - 50 w.p.m

යතුරු ලියන වේගය - 40 w.p.m

(ඇ) Word Processing , Spread Sheet, Data Base පිළිබඳ පරිගණක දැනුම

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවාවක් සම්පූර්ණ කිරීම.

හා

(අ) ස්ටෙනෝග්‍රැෆි සහ පරිගණක ආශ්‍රිතව ස්වාධීනව ලිපි ලේඛන සම්බන්ධ කටයුතු සිදු කිරීමේ හැකියාව.

(ආ) Word Processing, Spread Sheet, Data Base පිළිබඳ පරිගණක දැනුම

### කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා කාණ්ඩය (MA 2-2) - III ශ්‍රේණිය

**9. තාක්ෂණ සහකාර (සිවිල්) - MA 2-2- III ශ්‍රේණිය - තනතුරු 02**

**10. තාක්ෂණ සහකාර (යාන්ත්‍රික) - MA 2-2- III ශ්‍රේණිය - තනතුරු 01**

**11. තාක්ෂණ සහකාර (ප්‍රවාහන) - MA 2-2- III ශ්‍රේණිය - තනතුරු 01**

➢ **සුදුසුකම් හා සේවා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**වෘත්තීය**

1. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ලබා තිබීම.
2. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රාථමික මට්ටම (පුහුණු) (PL - 3) සේවා කාණ්ඩයේ I වන ශ්‍රේණියේ ස්ථිර තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ ප්‍රාථමික මට්ටමේ – පුහුණු සේවකයන්.

සහ

**වෘත්තීය**

අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) 04 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක් විසින් පවත්වන වෘත්තීය පරීක්ෂණයක් සමත් වීම.

### කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා කාණ්ඩය (MA 1-2) - III ශ්‍රේණිය

**12. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) MA 1-2 - III ශ්‍රේණිය - තනතුරු 06**

➢ **සුදුසුකම් හා සේවා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන**

(අ) සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රීසි ඇතුළු විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී අ. පො. ස (සා / පෙ) විභාගයෙන් විෂයන් හයක් සමත් වීම.

I. සිංහල / දෙමළ

II. ගණිතය

III. ඉංග්‍රීසි (තනතුරට අවශ්‍ය නම් පමණක්)

(ආ) අ. පො. ස (උ / පෙ) විභාගයෙන් විෂයන් තුනක් (03) සමත් වීම (පොදු ප්‍රශ්න පත්‍රය හැර).

(ඇ) පරිගණකයක වදන් සැකසුම (Word Processing), පැතුරුම්පත් (Excel), දත්ත පදනම (Data Base) සමග වැඩ කිරීමේ දැනුම, ලේකම් කටයුතු සම්බන්ධව පිළිගත් පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකෙනු ඇත.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

1. පහත සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික – පුහුණු (PL - 3) මට්ටම, ප්‍රාථමික – අර්ධ පුහුණු (PL - 2) මට්ටම සහ ප්‍රාථමික – නුපුහුණු (PL - 1) සේවකයන් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

**අධ්‍යාපන :**

සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රීසි ඇතුළු විෂයන් හතරකට(04) සම්මාන සමාර්ථය සහිතව අ. පො. ස (සා / පෙ) විභාගයෙන් විෂයන් හයක් (06) සමත් වීම.

I. සිංහල / දෙමළ

II. ගණිතය

III. ඉංග්‍රීසි (තනතුරට අවශ්‍ය නම් පමණක්)

සහ

ඉහත සේවක කාණ්ඩයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන :**

- ස්ථිර තනතුරකට පත්වීමට පෙර යම් සේවා කාලයක් හෝ පුහුණුව යටතේ සම්පූර්ණ කළ යුතු සේවා කාලයක්, ඉහත සඳහන් කළ පරිදි සුදුසුකම් සඳහා අවශ්‍ය වසර පහක (05) සේවා කාලය තුළ ගණන් නොගන්නා අතර, අනියම් / තාවකාලික පදනම මත ඇති ඕනෑම සේවා කාලයක් ද මේ සඳහා ගණන් ගනු නොලැබේ.
- MS - Office, Word, Excel සහ Power Point ඇතුළු පරිගණක පැකේජ හැසිරවීම හා වැඩ කිරීමේ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.

### ප්‍රාථමික මට්ටම(ශිල්පීය) සේවා කාණ්ඩය- (PL-3) -III ශ්‍රේණිය

**13. වෘත්තීය ශිල්පී (ගොඩනැගිලි සේවා) (PL- 3 ) III ශ්‍රේණිය - තනතුරු 02**

**14. වෘත්තීය ශිල්පී (යාන්ත්‍රික) (PL- 3 ) III ශ්‍රේණිය - තනතුරු 01**

**15. වෘත්තීය ශිල්පී (මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු) (PL- 3 ) III ශ්‍රේණිය - තනතුරු 01**

**16. ප්‍රදර්ශක (PL- 3 ) III ශ්‍රේණිය - තනතුරු 03**

**සේවා ස්ථානය - ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහල - අනුරාධපුර (ගල්කුලම)**

➢ **සුදුසුකම් හා සේවා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන :**

දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස සා/පෙළ විෂයන් 6ක් සමග සම්මාන 02 ක් සහිතව සමත් වීම.

**වෘත්තීය :**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රයේ (වෘත්තියේ) ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම හතර (04) ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර: (පහත 1 හෝ 2)**

**ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.**

2. ප්‍රාථමික මට්ටමේ – අර්ධ ශිල්පීය (PL 02) හෝ ශිල්පීය නොවන (PL 01) සේවා කාණ්ඩවල අවම වශයෙන් වසර 05ක සේවා පළපුරුද්දක් සහිත අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) දෙවන (02) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, වෘත්තීය පරීක්ෂණයකදී ඔප්පු කර තිබීම.

ඊළඟ පිටුවට....

# ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**ප්‍රාථමික මට්ටම (අර්ධ ශිල්පීය) සේවා කාණ්ඩය - (PL-2) –III ශ්‍රේණිය**

## 17. යන්ත්‍ර ක්‍රියාකරු (PL- 2) III ශ්‍රේණිය- තනතුරු 02

සේවා ස්ථානය - ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහල - අනුරාධපුර (ගල්කුලම)

➢ **සුදුසුකම් හා සේවා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන :**

(අ) අ. පො. ස ( සා. පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් 02ක් සමත්වීම

**වෘත්තීය :**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර: (පහත 1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන (PL 01) සේවා කාණ්ඩයේ අවම වශයෙන් වසර 05ක සේවා පළපුරුද්දක් සහිත අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) දෙවන (02) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, වෘත්තීය පරීක්ෂණයකදී ඔප්පු කර තිබීම.

**ප්‍රාථමික මට්ටම (ශිල්පීය නොවන) සේවා කාණ්ඩය - (PL-1) –III ශ්‍රේණිය**

## 18. අත් උදව්කරු (PL- 1) III ශ්‍රේණිය - තනතුරු 01

➢ **සුදුසුකම් හා සේවා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන :**

(අ) අ. පො. ස ( සා. පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් 02ක් සමත්වීම.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය:**

ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM 2-1) සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM 1-3)

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

කළමනාකරු මට්ටම - (MM 1-1), කනිෂ්ඨ කළමනාකරු මට්ටම - (JM 1-2)

කළමනාකරණ සහකාර (තාක්ෂණික) - (MA 2-2) , කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ( MA 1-2)

**ලිඛිත තරඟකාරී විභාගය සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

ප්‍රාථමික මට්ටම (ශිල්පීය) (PL – 3)

**වෘත්තීය පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

ප්‍රාථමික මට්ටම (අර්ධ ශිල්පීය) ( PL – 2) සහ ප්‍රාථමික මට්ටම (ශිල්පීය නොවන) ( PL – 1)

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

## 2016.01.01 දින සිට එක් එක් සේවා කාණ්ඩ සඳහා අදාළ වැටුප් කේත අංක සහ වැටුප් පරිමාණ.

**ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM 2-1)**

HM 2-1 රු. 91,645/- 12 X 2,700/- 124,045/-

**ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM 1-3)**

HM 1-3 රු. 86,865/ - 15 x 2,270/- 120,915/-

**කළමනාකරු මට්ටම (MM 1-1)**

MM 1-1 රු. 53,175/- 10 x 1,375/- 15 x 1,910/- 95,575 /-

**කනිෂ්ඨ කළමනාකරු මට්ටම (JM 1-2)**

JM 1-2 රු. 43,355/- 10 x 755/- 18 x 1,135/- 71,335/-

**කළමනාකරණ සහකාර (තාක්ෂණික) (MA 2-2)**

MA 2 - 2 රු. 30,310/- 10 x 300/- 7 x 350/- 4 x 600/- 20 x 710/- 52,360/-

**කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1-2)**

MA 1 - 2 රු. 27,910/- 10 x 300/- 7 x350/- 12 x 600/- 12 x 710/- 49,080/-

**ප්‍රාථමික මට්ටම (ශිල්පීය) (PL - 3)**

PL - 3 රු. 26,290/- 10 x 270/- 10 x 300/- 10x 330/- 12 x 350/- 39,490/-

**ප්‍රාථමික මට්ටම (අර්ධ ශිල්පීය) ( PL - 2)**

PL - 2 රු. 25,750/- 10 x 270/- 10 x 300/- 10 x 330/- 12 x 350/- 38,950/-

**ප්‍රාථමික මට්ටම (ශිල්පීය නොවන) ( PL - 1)**

PL - 1 රු. 24,750/- 10 x 250/- 10 x 270/- 7 x300/- 15 x 330/- 37,000/-

### සෑම අයදුම්කරුවෙකුම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් හා ජවයකින් හෙබි විය යුතු ය.

### වයස් සීමාව :

**ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM 2-1)**

- වයස අවුරුදු 35ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය.

**ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM 1-3)**

- අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**කළමනාකරු මට්ටම - (MM 1-1) , කනිෂ්ඨ කළමනාකරු මට්ටම - (JM 1-2)**

- අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**කළමනාකරණ සහකාර (තාක්ෂණික) - (MA 2-2), කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - ( MA 1-2)**

- අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**ප්‍රාථමික මට්ටම (ශිල්පීය) (PL – 3) , ප්‍රාථමික මට්ටම (අර්ධ ශිල්පීය) ( PL – 2), ප්‍රාථමික මට්ටම (ශිල්පීය නොවන) ( PL – 1)**

- අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ දැනටමත් රජයේ / ව්‍යවස්ථාපිත ආයතනවල නියුක්ත අයදුම්කරුවන්ට ඉහත සඳහන් උපරිම වයස් සීමාවන් බලනොපායි.

### වෙනත් ප්‍රතිලාභ

❖ රජයේ අනුමත දීමනා.

❖ සේවකයාගේ වැටුප් පදනම් කොටගෙන සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක දායකවීමක් ද, සේවකයාගෙන් 10% ක දායකවීමක් ද සමඟ ආයතනය විසින් සේවකයා වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක් ද බැර කිරීමක් කරනු ලැබේ.

❖ "අග්‍රහාර රන්" වෛද්‍ය රක්ෂණ පහසුකම්.

❖ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයන්ට අනුකූලව ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ.

❖ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයන්ට අනුකූලව ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටම හා කළමනාකාර මට්ටම සඳහා ප්‍රවාහන පහසුකම් සහ සන්නිවේදන පහසුකම් හා බිල්පත් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

අයදුම්කරුගේ ජීව දත්ත ඇතුළත්ව, නිසි පරිදි පිළියෙල කරන ලද අයදුම්පත්, අධ්‍යාපන හා වෘත්තීය, පළපුරුද්ද පිළිබඳ සහතික කරන ලද සහතික පිටපත් සමඟ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත 2023. 10.12 දින හෝ ඊට පෙර සභාපති වෙත ලැබීමට සැලැස්විය යුතුය. රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / ආයතනවල සේවය කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, තම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයන් සහිතව, ඔවුන් තෝරා ගතහොත් දැනට දරන තනතුරින් නිදහස් කිරීමට හැකිද යන්න සඳහන් කර එවිය යුතු ය. අයදුම්පත් එවීමේදී **ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම් කරන තනතුර** පැහැදිලිව සඳහන් කර එවිය යුතු ය.

අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සපුරා ඇති තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**සභාපති**

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

**"සව්සිරිපාය" 123, විජේරාම මාවත,**

**කොළඹ 07.**